# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,450- 2006 ජූනි 16 වැනි සිකුරාදා - 2006.06.16

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ජේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... .. | 462 |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 458 | මිළ පාලන දැන්වීම් .. ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | 464 |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 475 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — | සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |


*සැ. යු.* —වීර පොදුජන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2006 මැයි මස 26 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 ජූනි මස 23 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 ජූනි මස 09 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2006 අංක 122

DRF/21/RECT/2205.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

### විශ්‍රාම ගැනිම

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2005 නොවැම්බර් මස 29 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපතිඋතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/50630 මේජර් ජෙනරාල් හේරත් මුදියන්සේලාගේ නිමල් ක්‍රිෂ්ණරත්න, ආර්එස්පී යූඑස්පී.

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2005 නොවැම්බර් මස 29 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/50630 මේජර් ජෙනරාල් හේරත් මුදියන්සේලාගේ නිමල් ක්‍රිෂ්ණරත්න, ආර්එස්පී යූඑස්පී

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 පෙබරවාරි මස 20 වැනි දින,
කොළඹ දී ය.

06-401

---

2006 අංක 123

DRF/21/RECT/2219.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපතිතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

### විශ්‍රාම ගැනිම

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2005 නොවැම්බර් මස 29 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපතිතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/50570 මේජර් ජෙනරාල් මාපිටියගේ දොන් සුසිල් චන්ද්‍රපාල, ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී.

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2005 නොවැම්බර් මස 29 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිඋතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/50570 මේජර් ජෙනරාල් මාපිටියගේ දොන් සුසිල් චන්ද්‍රපාල, ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

06-406

---

2006 අංක 124

DRF/21/RECT/2243.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

### විශ්‍රාම ගැනිම

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2005 දෙසැම්බර් මස 11 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/50677 මේජර් ජෙනරල් වැදිගේ බැසිල් පීරිස්, යූඑස්පී

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2005 දෙසැම්බර් මස 11 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/50677 මේජර් ජෙනරාල් වැදිගේ බැසිල් පීරිස්, යූඑස්පී.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජනවාරි මස 17 වැනි දින,
කොළඹ දී ය.

06-400

---

2006 අංක 125

DRF/21/RECT/2248.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

#### විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2006 ජනවාරි මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/50662 මේජර් ජෙනරල් ගාමිණී හෙට්ටිආරච්චි, ඩබ්ඩබ්පී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී.

#### ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2006 ජනවාරි මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/50662 මේජර් ජෙනරල් ගාමිණී හෙට්ටිආරච්චි, ඩබ්ඩබ්පී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජනවාරි මස 17 වැනි දින,
කොළඹ දී ය.

06-407

2006 අංක 126

DRF/21/RECT/2236.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිලය ස්ථිර කිරීමක්, නිල උසස් කිරීමක්, විශ්‍රාම ගැනීමක් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

#### නිල ස්ථිර කිරීම

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2005 නොවැම්බර් මස 24 වැනි දින සිට කර්නල් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/61640 ලුතිනන් කර්නල් (තාවකාලික කර්නල්) කලුඅප්පුකංකානම්ගේ සෙනත් දේවප්‍රිය කරුණාරත්න.

#### නිල උසස් කිරීම

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2005 නොවැම්බර් මස 24 වැනි දින සිට බ්‍රිගේඩියර් නිලයට උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/61640 කර්නල් කලුඅප්පුකංකානම්ගේ සෙනත් දේවප්‍රිය කරුණාරත්න

#### විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2005 නොවැම්බර් මස 25 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/61640 බ්‍රිගේඩියර් කලුඅප්පුකංකානම්ගේ සෙනත් දේවප්‍රිය කරුණාරත්න.

#### ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2005 නොවැම්බර් මස 25 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/61640 බ්‍රිගේඩියර් කලුඅප්පුකංකානම්ගේ සෙනත් දේවප්‍රිය කරුණාරත්න.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජනවාරි මස 13 වැනි දින,
කොළඹ දී ය.

06-404

2006 අංක 127

DRF/21/RECT/2250.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

### නිල ස්ථිර කිරීම

පහත නම සඳහන් නිලධාරියා 2005 දෙසැම්බර් මස 30 වැනි දින සිට ලුතිනන් කර්නල් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/60577 මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) සුභාෂ් ජනක නලින කීර්ති රිටිගහපල, ආර්එස්පී පීඑස්සී කරෙ.

### විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් නිලධාරියා 2005 දෙසැම්බර් මස 31 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

නි/60577 ලුතිනන් කර්නල් සුභාෂ් ජනක නලින කීර්ති රිටිගහපල, ආර්එස්පී පීඑස්සී කරෙ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජනවාරි මස 20 වැනි දින,
කොළඹ දී ය.

06-405

---

2006 අංක 128

අංකය : ඩී/ඒඑෆ්/8.

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම

පහත නම් සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් ඇති දින සිට තාවකාලික එයාර් කොමදෝරු නිලයට උසස් කෙරේ :

ගෲප් කැප්ටන් තිලක් ලොයිඩ් විජේරත්න දිසානායක (01287) - උපකරණ - 2006.01.01.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මාර්තු මස 23 වැනි දින,
කොළඹ දී ය.

06-402

---

2006 අංක 129

අංකය : ඩී/ඒඑෆ්/528.

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2006 ජූනි මස 30 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත :

විං කමාන්ඩර් දොන් අසේල දාඹුරේ විතානගේ (01549) - පරිපාලන.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මාර්තු මස 09 වැනි දින,
කොළඹ දී ය.

06-408

---

2006 අංක 130

අංකය : ඩී/ඒඑෆ්/529.

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2006 අගෝස්තු මස 30 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත :

විං කමාන්ඩර් ලලිත් සිරිලාල් අබේසේකර (01441) - පාලන/රෙජි.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මාර්තු මස 15 වැනි දින,
කොළඹ දී ය.

06-410

---

2006 අංක 131

අංකය : ඩී/ඒඑෆ්/527.

## ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2006 ජූලි මස 31 වන දින සිට පහත නම සඳහන් නිලධාරිණියගේ ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදා සේවයෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :

| *නිලය* | *සම්පූර්ණ නම සහ සේවා අංකය* | *ශාඛාව* |
|---|---|---|
| ස්කොඩ්රන් ලීඩර් | වේලකා ඉරේෂා ජිනාති අමරතුංග (ඕ ඩබ්ලිව්/01009) | පරිපාලන |

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මාර්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

06-403

---

2006 අංක 132

අංකය : ඩී/ඒඑප්/537.

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

2007 ජනවාරි මස 01 වන දින සිට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පහත නම සඳහන් නිලධාරියාගේ අධිකාරයෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ස්කොඩ්රන් ලීඩර් කොටගෙදර ලියනගේ ඇශ්ලි දීපාල් සූජීව පෙරේරා - (01994) - වෛද්‍ය

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක/මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මාර්තු මස 09 වැනි දින,
කොළඹ දී ය.

06-412

2006 අංක 133

අංකය : ඩී/ඒඑෆ්/වී/65.

## ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

2006 මාර්තු මස 01 වන දින සිට පහත නම සඳහන් නිලධාරියාගේ ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදා සේවයෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :

| *නිලය* | *සම්පූර්ණ නම සහ සේවා අංකය* | *ශාඛාව* |
|---|---|---|
| බලපංති ලුතිනන් | සුපුන සඳකාන් විදානගමච්චිගේ (ස්/0459) | කාර්මික ඉංජිනේරු |

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මාර්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

06-409

---

2006 අංක 134

අංකය ඩී/ඒෆ්/වී/66.

## ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

2006 මාර්තු මස 01 වන දින සිට පහත නම සඳහන් නිලධාරියාගේ ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදා සේවයෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :

| *නිලය* | *සම්පූර්ණ නම සහ සේවා අංකය* | *ශාඛාව* |
|---|---|---|
| බලපංති ලුතිනන් | දිවදලගේ නිරෝෂ් තරංග සිල්වා (ස්/0489) | කාර්මික ඉංජිනේරු |

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මාර්තු මස 20 දින,
කොළඹ දී ය.

06 – 411

# ආණ්ඩුවේ නිවේදන

## විවාහ සිදුකිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධිවිධාන අනුව ලබුගම කරුණානායකගේ රත්නසිරි නමැති, ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම, ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එල්. කේ. රත්නසිරි,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2006 මැයි මස 09 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය,
කොළඹ 11.

| *අංකය* | *ලියාපදිංචි කිරීමේ දිනය* | *විස්තරය* | *පිහිටීම* | *දේවගැතිතැන, අයිතිකරු හෝ භාරකරු* | *ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද* |
|---|---|---|---|---|---|
| 1395 | 2006.04.27 | උඩුමහල් දෙව්මැදුර | වත්තල | දුෂාන්ත ලක්ෂමන් රුදිගු පියතුමා | ක්‍රිස්තියානි |

06-372

---

## විවාහ සිදුකිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධිවිධාන අනුව ලබුගම කරුණානායකගේ රත්නසිරි නමැති, ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම, ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එල්. කේ. රත්නසිරි,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2006 මැයි මස 19 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය,
කොළඹ 11.

| *අංකය* | *ලියාපදිංචි කිරීමේ දිනය* | *විස්තරය* | *පිහිටීම* | *දේවගැතිතැන, අයිතිකරු හෝ භාරකරු* | *ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද* |
|---|---|---|---|---|---|
| 1396 | 2006.05.08 | ශාන්ත සෙබස්තියන් දෙව්මැදුර | හුණුපිටිය | අති උතුම් රේමන් පීරිස් රදගුරු හිමි | රෝමානු කතෝලික |

06-371

**මහනුවර දිස්ත්‍රික්කයේ මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පහුරුගොල්ල ග්‍රාම නිලධාරී වසමේ නාමය රඹුක්වැල්ල නැගෙනහිර යනුවෙන් සංශෝධනය කිරීම**

මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයට අයත් මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 769 පහුරුගොල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නම 2006.05.26 දින සිට අංක 769 රඹුක්වැල්ල නැගෙනහිර යනුවෙන් සංශෝධනය කරනු ලබන බව මහජනයාගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. නාම සංශෝධනය කරනු ලබන ග්‍රාම නිලධාරී කොට්ඨාසයට අයත්වන ගම්වල නම් උපලේඛන අංක 01හි සඳහන් වේ.

03. ඒ අනුව රඹුක්වැල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයට අයත්වන මහෙස්ත්‍රාත් උසාවිය, පොලිස් බල ප්‍රදේශ, උප්පැන්න විවාහ හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස, පළාත් පාලන ආයතන, ඡන්ද ප්‍රදේශය හා වසමේ කොට්ඨාස මායිම් උපලේඛන අංක 02හි සඳහන් වේ.

බී. ජී. කරුණාරත්න,
ලේකම්,
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

## උපලේඛන I

### ග්‍රාම නිලධාරී වසම් ප්‍රතිශෝධනය කිරීම

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *දැනට පවතින වසමේ නම හා ඊට අයත් ගම් හා වතු* | *නාම සංශෝධනයෙන් පසු වසමේ හා ඊට අයත් ගම් හා වතු* |
|---|---|---|---|
| මහනුවර | මැදදුම්බර | පහුරුගොල්ල වසම<br>අයත් ගම් හා වතු<br>1. එක්කස්ස<br>2. පහුර<br>3. සියඹලාගස්තැන්න | රඹුක්වැල්ල නැගෙනහිර<br>අයත් ගම් හා වතු<br>1. රඹුක්වැල්ල<br>2. එක්කස්ස<br>3. පහුරුගොල්ල<br>4. සියඹලාගස්තැන්න |

## උපලේඛන II

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *දැනට පවතින වසමේ නම හා අංකය* | *මහෙස්ත්‍රාත් උසාවිය /පොලීසිය* | *උප්පැන්න, විවාහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය* | *පළාත් පාලන ආයතනය* | *ඡන්ද ප්‍රදේශය* | *වසමේ මායිම්* |
|---|---|---|---|---|---|---|---|
| මහනුවර | මැදදුම්බර | පහුරුගොල්ල 769 | තෙල්දෙනිය<br>තෙල්දෙනිය | පලිස්පත්තුව<br>නැගෙනහිර | මැදදුම්බර<br>ප්‍රාදේශීය<br>සභාව | "ඉ" තෙල්දෙනිය | උ: රංමුල්ල වසම හා උඩවෙල වසම<br>ද: මීගහමඩිත්ත වසම හා වික්ටෝරියා ජලාශය<br>නැ: මීගහමඩිත්ත වසම හා අනුරුද්ධ රත්වත්ත මාර්ගය<br>බ: රඹුක්වැල්ල වසම සහ වික්ටෝරියා ජලාශය |

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

## යාපනය විශ්ව විද්‍යාලය

### 2002 දෙසැම්බර් මස 31න් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම

| කලින් වර්ෂය | 1. | *ආදායම* | | සටහන | | |
|---|---|---|---|---|---|---|
| 231,800,000.00 | 01. | රජයේ ප්‍රදානය | අ. පුනරාවර්තන | | 228,900,000.00 | |
| 9,000,000.00 | | | වි. ප්‍ර. කො. ස. | | 18,006,000.00 | |
| 1,300,000.00 | | | ජී. ටී. එල්. ටී. | | 1,130,000.00 | |
| | | | බැඳුම්කර බැඳීම් | | 2,000,000.00 | 250,036,000.00 |
| 35,335,300.00 | | | ආ. ශිෂ්‍යාධාර | | | 36,406,040.00 |
| | | | ඇ. මහපොළ ශිෂ්‍යත්ව | | | |
| 4,117,750.00 | | | 1. භාණ්ඩාගාර උපංගය | | | 7,855,960.00 |
| 10,393,950.00 | | | 2. භාරකාර උපාංගය | | | 23,514,650.00 |
| | | | ඈ. පිරිනැමූ ශිෂ්‍යත්ව | | | |
| | | | 1. භාණ්ඩාර උපාංගය | | | 14,500.00 |
| 5,626.50 | 02. | ආයෝජනවලින් පොළිය | | | | 6,723.00 |
| 1,234,164.96 | 03. | ණය මුදල් වලින් පොළිය | | | | 1,151,238.10 |
| 409,171.80 | 04. | දේපලවලින් පොළිය | | | | 441,905.00 |
| 91,017.00 | 05. | පැරණි භාණ්ඩ විකිණීම | | | | 24,530.00 |
| 25,323.50 | 06. | නිශ්පාදන විකිණීම | | | | 36,760.00 |
| 2,220,898.26 | 07. | විවිධ ලැබීම් | | | | 1,753,494.76 |
| 602,610.00 | 08. | ලියාපදිංචි ගාස්තු | උපාධි අපේක්ෂකයෝ | | 596,650.00 | |
| 111,300.00 | | | පශ්චාත් උපාධිධරයෝ | | 128,525.00 | 725,175.00 |
| 713,125.00 | 09. | අධ්‍යයන ගාස්තු | පශ්චාත් උපාධිධරයෝ | | | 909,925.00 |
| 116,775.00 | 10. | විභාග ගාස්තු | උපාධි අපේක්ෂකයෝ | | 190,050.00 | |
| 60,665.00 | | | පශ්චාත් උපාධිධරයෝ | | 66,000.00 | 256,050.00 |
| 21,538.00 | 11. | ප්‍රකාශන විකිණීම | | | | 60,611.75 |
| 6,393.00 | 12. | පුස්තකාල දඩ | | | | 9,622.00 |
| 360,600.00 | 13. | වෛද්‍ය ගාස්තු | | | | 367,725.00 |
| 196,073.53 | 14. | ලැබුණු වට්ටම් | | | | 85,406.57 |
| 136,358.53 | 15. | වෙනත් ක්‍රියාවලින් | | | | 291,031.37 |
| 192,600.00 | 16. | බාහිර අධ්‍යයන ඒකකය | | | | 126,640.00 |
| 13,225.00 | 17. | සේවක අධ්‍යයනය | | | | 4,600.00 |
| 1,223,419.06 | 18. | බාහිර විභාග | ලැබීම් | | 1,830,229.50 | |
| | | | ගෙවීම් | | 1,408,850.61 | 421,378.89 |
| 94,300.00 | 19. | මුද්‍රණ ඒකකය | ලැබීම් | | 273,400.00 | |
| 299,782,184.14 | | | ගෙවීම් | | 318,237.25 | (44,837.25) |
| | | | මුළු ආදායම | | | 324,455,129.19 |
| | II. | *අඩුකෙරෙන වියදම* | | | | |
| 105,286,572.25 | 01. | සාමාන්‍ය පරිපාලන කාර්ය මණ්ඩල සේවා | | 41,353,800.88 | | |
| | | 1. ක්ෂය | | 64,451,418.04 | | |
| | | 2. පාරිතෝෂික ප්‍රතිපාදන | | 2,176,999.77 | | 107,982,218.69 |
| 177,579,411.68 | 02. | අධ්‍යයන සේවා | | | | 195,402,875.71 |
| 56,226,805.24 | 03. | ශුභසාධන සේවා | | | | 73,235,729.47 |
| 5,941,059.85 | 04. | ඉඩම් ගොඩනැගිලි නඩත්තුව | | | | 6,809,451.82 |
| | 05. | පර්යේෂණ හා ප්‍රකාශන | | | | |
| | 06. | පශ්චාත් උපාධි අධ්‍යයන | | | | |
| 1,439,705.42 | 07. | ව්‍යාප්ති සේවා | | | | |
| 1,555,920.60 | 08. | ආනුෂංගික කටයුතු | | | | 1,910,357.50 |
| 10,946,367.48 | 09. | පුස්තකාල සේවා | | | | 1,476,666.39 |
| | 10. | ජී. ටී. එල්. ටී වැඩසටහන | | | | 12,214,167.00 |
| 358,975,842.52 | | | | | | 362,251.00 |
| | | මුළු වියදම | | | | 399,393,717.58 |
| (59,193,658.38) | | වර්ෂය සඳහා අතිරික්ත වියදම/ආදායම | | | | (74,938,588.39) |

## ආදායම් සහ වියදම් විසර්ජන ගිණුම

| | | | | | |
|---|---|---|---|---|---|
| (59,192,658.38) | අතිරික්ත වියදම/ආදායම (හිඟය) | | | | (74,938,588.39) |
| (254,544,735.19) | කලින් වර්ෂයෙන් ඉදිරියට ගෙනා ශේෂය | | | (367,561,538.61) | |
| (52,170,749.98) | *එකතු කළා* : භාණ්ඩාගාර තැන්පතු ගිණුමෙන් මාරු කිරීම | | | | |
| | | | | (367,561,538.61) | |
| 111,163.89 | කලින් වර්ෂයේ ගැලපීම | ලැබීම් | 2,914,614.65 | | |
| | | ගෙවීම් | 185,060.50 | 2,729,554.15 | (364,831,984.46) |
| (365,796,979.66) | විසර්ජනය කෙරෙන මුදල | | | | (439,770,572.85) |
| 1,300,000.00 | *මාරු කළා* : ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ මධ්‍යස්ථානයට | | | 767,749.00 | |
| 1,223,419.06 | බාහිර විභාගවලට | | | 421,378.89 | 1,189,127.89 |
| 241,139.89 | කපාහැරීම් සහ වෙනත් ගැලපීම් | | | | 199,410.78 |
| (368,561,538.61) | ශේෂ පත්‍රයෙන් ඉදිරියට ගෙනා ශේෂය | | | | (441,159,111.52) |

නිවරදි බවට සහතික කරන ලදී.

මාහාචාර්ය එස් . මෝහන්දාස්,
ගිණුම් නිලධාරී,
උප කුලපති.

වී. කාන්තමූර්ති,
මූල්‍යාධිකාරී *වෙනුවට*

## යාපනය විශ්ව විද්‍යාලය. ශ්‍රී ලංකාව

## 2002 දෙසැම්බර් මස 31 වැනි දින ශේෂ පත්‍රය

| කලින් වර්ෂය අවසානයේ ශේෂය | | | | | |
|---|---|---|---|---|---|
| | 01. | **ප්‍රග්ධනය** | | | |
| 797,747,057.66 | අ. | වැය කළ ප්‍රාග්ධනය | | 854,960,236.26 | |
| | ආ. | වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදානය | | | |
| 1,288,250.73 | | (A උපලේඛනය) | | 1,575,072.13 | |
| | ඇ. | ආදායම්, ත්‍යාග හා පොදු සංචිතයෙන් | | | |
| 17,807,089.46 | | ප්‍රග්ධන වියදමට දායක මුදල | | 18,651,089.46 | |
| | | (B උපලේඛනය) | | | |
| | ඇ. | වෙනත් ආයතනවලින් ගත් වත්කම්වලට | | | |
| 16,843,764,54 | | දායක මුදල | | 21,093,764.54 | |
| | ඉ. | පරිගනක සංවර්ධනය | | | |
| 398,960.00 | | වැය කළ සංචිතය | | 398,960.00 | 896,679,122.39 |
| 834,085,122.39 | | | | | |
| | 02. | **සංචිත** | | | |
| (368,561,538.61) | අ. | පොදු සංචිත | | | (441,159,111.52) |
| (368,561,538.61) | ආ. | බැඳුම්කරයේ පොදු සංචිතය සහ බැඳුම්කර බැදීම | | | |
| 10,967,693.91 | 1. | ලැබුණු | 6,070,782.72 | | |
| 79,888,486.40 | 2. | ලැබිය යුතු | 79,978,317.59 | 86,049,100.31 | |
| 5,321,969.97 | 3. | ලැබුණු පොලිය | | 1,672,259.40 | 87,721,359.71 |
| 96,178,150.28 | | | | | |
| 57,860.00 | ඇ. | ප්‍රග්ධන සංචිතය | | | 57,860.00 |
| | 03. | **සීමාසහිත අරමුදල් සහ නිශ්චිත සංචිත** | | | |
| 37,087,407.64 | අ. | පරිත්‍යාග අරමුදල (C උපලේඛනය) | 38,057,070.19 | | |
| 378,624.91 | ආ. | විශේෂ ප්‍රදානය (D උපලේඛනය) | 428,624.91 | | |
| 253,596.78 | ඇ. | පර්යේෂණ ප්‍රදානය (E උපලේඛනය) | 335,347.90 | | |
| 16,404,831.04 | ඇ. | තෑගි සහ පරිත්‍යාග (F උපලේඛනය) | 17,644,565.83 | | |
| 2,065,397.64 | ඉ. | 1. උපකුලපති ශුභසාධක අරමුදල | 2,554,875.64 | | |
| 25,620 | | 2. අධිපති ශුභසාධක අරමුදල | 24,820.00 | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 105,528.41 | ඊ. | පරිගනක සංවර්ධන සංචිතය | | 105,528.41 | | |
| 727,295.36 | උ. | ජෛව රසායන බාහිර පාඨමලා අරමුදල | | 582,170.36 | | |
| 220,000.00 | ඌ. | මාණ්ඩලික නිලධාරීන් සඳහා පරිගණක අධ්‍යාපනය | | 220,000.00 | | |
| 6,272,756.59 | එ. | බාහිර විභාගවලින් ආදායම | | | | |
| | | වැයකළ | 6,127,005.00 | | | |
| | | වැය නොකළ | 567,130.48 | 6,694,135.48 | | |
| 2,436,831.75 | ඒ. | ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් මධ්‍යස්ථානය | | | | |
| | | වැය කළ | 90,337.50 | | | |
| | | වැය නොකළ | 3,095,088.75 | 3,185,426.25 | | |
| 50,975.00 | ඔ. | කළමනාකරණ පීඨ සංවර්ධන | | | | |
| | | අරමුදලට ප්‍රදානය | | 50,975.00 | | |
| 68,101,462.98 | ඕ. | පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන | | 69,851,772.75 | 139,735,312.72 | |
| | | ස්වයං මූල්‍යකරණ පාඨමාලාවල ශේෂය | | | | |
| 433,031.31 | 1. | ශාරීරික අධ්‍යාපන ඩිප්ලෝමා | | 704,966.90 | | |
| 384,810.38 | 2. | ධීවර සංවර්ධන මධ්‍යස්ථාන | | 595,600.92 | | |
| 544,548,60 | 3. | රාජ්‍ය පරිපාලන පශ්චාත් උපාධි ඩිප්ලෝමා | | 841,053.63 | | |
| 14,421.87 | 4. | Msc පාඨමාලාවේ ජෛව රසායනය | | (49,546.25) | | |
| 1,755,109.00 | 5. | අධ්‍යාපනපති පාඨමාලාව | | 2,230,282.00 | | |
| 219,472.09 | 6. | ඉංග්‍රීසි සහතික පාඨමාලාව | | 512,026.75 | | |
| 40,961.42 | 7. | පරිගණක සහතික පාඨමාලාව | | 70,077.45 | | |
| 1,090,017.75 | 8. | සෞඛ්‍ය අධ්‍යයන ඒකකය | | 160,850.34 | | |
| | 9. | ඉංග්‍රීසි ඩිප්ලෝමා | | 7,600.00 | | |
| | 10. | සංස්කෘතික අධ්‍යයන පිළිබඳ MA පාඨමාලාව | | 572,700.00 | 5,645,611.74 | 145,380,924.46 |
| 138,612,700.52 | | | | | | |
| 11,178,729.19 | 04. | ප්‍රග්ධන ලැබීම් (G උපලේඛනය) | | | | 11,178,729.19 |
| 711,551,023.77 | | | | | | 699,858,884.23 |
| | 06. | ස්ථාවර වත්කම් | පිරිවැය | ක්ෂය ප්‍රතිපාදන | ශුද්ධ වටිනාකම | |
| 85,419,738.31 | අ. | ඉඩම් හා ගොඩනැගිලි (11 උපලේඛනය) | 113,359,047.64 | 24,441,255.11 | 88,917,792.53 | |
| 2,539,761.03 | ආ | අර්ධස්ථිර ගෙඩනැගිලි | 7,215,431.56 | 5,036,442.11 | 2,178,989.45 | |
| 92,364,617.72 | ඇ. | කාර්යාල ගෘහභාණ්ඩ හා උප. (1 උප) | 255,893,520.64 | 163,367,381.64 | 92,526,139.00 | |
| 26,474,436.59 | ඇ | පුස්තකාල පොත් හා වාරසඟරා | 105,321,780.81 | 96,128,065.33 | 9,193,715.48 | |
| 404,198.13 | ඉ | මෝටර්වාහන | 6,858,114.75 | 6,858,113.75 | 1.00 | |
| - | ඊ | ලෝගු | 1,839,465.50 | 1,839,465.50 | | |
| 213,367.66 | එ | දුරකථන හුවමාරු | 1,401,972.96 | 1,127,453.68 | 274,519.28 | |
| 1,142,911.67 | ඒ | යන්ත්‍රාගාර හා යන්ත්‍ර (I උපලේඛනය) | 2,114,610.00 | 1,084,773.33 | 1,029,836.67 | |
| 104,200.00 | ඔ | පශු සම්පත් | 104,200.00 | | 104,200.00 | |
| 208,663,231.11 | | | 494,108,143.86 | 299,882,950.45 | 194,225,193.41 | 194,225,193.41 |
| | 07. | ආයෝජන | | | | |
| 29,907,443.80 | අ. | පරිත්‍යාග අරමුදල් ආයෝජනය | | | 30,617,460.56 | |
| 312,872.00 | ආ | ඇප තැන්පතු (K උපලේඛනය) | | | 343,854.00 | |
| 14,924,440.64 | ඇ | විවිධ ආයෝජන (L උපලේඛනය) | | | 9,625,611.72 | |
| 1,717,690.54 | ඇ | උපකුලපති ශුභසාධන අරමුදල් | | | 1,717,690.54 | 42,304,616.82 |
| 46,862,446.98 | | ආයෝජන | | | | |
| 144,258,796.53 | 08. | කෙරීගෙනයන වැඩ | | | | 144,258,796.53 |
| | 09. | ප්‍රවර්ධන වත්කම් | | | | |
| | අ. | 1. ගබඩා අත්තිකාරම් | | | | |
| 4,949,820.05 | | 1. U/J | 3,887.453.35 | | | |
| 466,970.88 | | 2. වවුනියා මණ්ඩපය | 358,557.41 | | 4,246,010.76 | |
| | | 2.. අංශයේ තිබෙන තොග | | | | |
| 7,758,434.33 | | 1. U/J | | 7,020,459.13 | | |
| 807,036.53 | | 2. වවුනියා මණ්ඩපය | | 1,296,832..76 | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 3. | ගබඩා අත්තිකාරම් ගිණුම | | | |
| 41,795.25 | | කෘෂිකර්ම පීඨයේ කටයුතු | 41,795.25 | | |
| | 4. | ඉංග්‍රීසි ලේඛන | 7,570.00 | | |
| 7,570.00 | | වවුනියා මණ්ඩපය | | 8,366,657.14 | |
| | ආ. | විවිධ ණයගැතියෝ | | | |
| 79,888,486.40 | 1 | බැඳුම්කර බැඳීම් | 79,978,317.59 | | |
| 2,338,896.40 | 2. | වෙනත් (M උපලේඛනය) | 2,356,445.63 | 82,334,763.22 | |
| | ඇ. | ණය සහ අත්තිකාරම්/කාර්ය | | | |
| 32,586,881.07 | | මණ්ඩලය (N උපලේඛනය) | 29,599,873.28 | | |
| 76,234.50 | ඈ. | ණය හා අත්තිකාරම්/ශිෂ්‍ය ((O උප) | 75,234.50 | | |
| 26,586,078.30 | ඈ. | සැපයුම් සේවා අත්තිකාරම් (P උප) | 3,149,995.15 | | |
| 150,666,265.83 | ඉ. | ගොඩනැගිලි අත්තිකාරම් (Q උප) | 193,469,950.83 | | |
| 13,456,427.27 | ඊ. | මුදල් පොත් ශේෂය (R උප) | 12,309,375.35 | | |
| 13,279.50 | එ. | අක්මුදල (S උපලේඛනය) | 9,746.50 | | |
| 18,371,874.07 | ඒ. | ආනයන අත්තිකාරම් (T උපලේඛනය) | 4,644,454.56 | | |
| 3,589,288.97 | ඔ. | වෙනත් (U උපලේඛනය) | 10,072,031.57 | 253,330,661.74 | 348,278,092.86 |
| 341,605,339.35 | | | | | 729,066,699.62 |
| 741,389,813.97 | | | | | |
| | | අඩු කළා : ප්‍රවර්තන බැරකම් | | | |
| 2,372,186.60 | අ. | තැන්පතු (V උපලේඛනය) | | 2,765,526.60 | |
| 2,996,082.90 | ආ. | විවිධ ණයහිමියෝ (W උපලේඛනය) | | 5,945,498.24 | |
| 2,243,547.12 | ඇ. | සමුච්චිත වියදම් | | 2,397,255.95 | |
| 1,598,763.18 | ඈ. | ගෙවීමට තිබෙන වේතන (X උප) | | 1,836,354.05 | |
| 4,900.00 | ඉ. | අවලංගු කළ චෙක්පත් | | 14,117.21 | |
| 20,623,310.40 | ඊ. | වෙනත් (Y උපලේඛනය) | | 16,249,063.34 | 29,207,815.39 |
| 29,838,790.20 | | | | | |
| 711,551,023.77 | | | | | 699,858,884.23 |

නිවැරදි බවට සහතික කරන ලදී.

මහාචාර්ය එස්. මෝහන්දාස්,
ගණක නිලධාරී,
උපකුලපති.

වී. කාන්තමූර්ති,
මූල්‍යාධිකාරී.

උපකුලපති,
යාපනය විශ්වවිද්‍යාලය.

යාපනය විශ්ව විද්‍යාලයේ 2002 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳව 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

යාපනය විශ්වවිද්‍යාලයේ 2002 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම්, 1978 අංක16 දරන විශ්ව විද්‍යාල පනතේ 108 (1) සහ III වගන්ති සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) සහ (7) උපවගන්ති සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2003 ජූලි 24 වැනි දින විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී.

### 1.2 විගණන විෂය පථය

මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ සමාලෝචනය සහ ගණුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශයන් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්, විධි සහ පරිචයන්ට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනයන් හි දැක්වෙන අගයන් සහ හෙළදරව් කිරීම්වලට උපකාරවන සාක්ෂි පරීක්ෂා කිරීම, මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගණකාධිකරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ නිගමන තක්සේරු කිරීම, මූල්‍ය ප්‍රකාශවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම සහ යොදා ගන්නා ලද ගණකාධිකරණ ප්‍රතිපත්ති සුදුසුද, ඒවා ඒකාකාරීව අනුගමනය කරන ලද්දේ ද සහ ප්‍රමාණවත් පරිදි

හෙළිදරව් කරන ලද්දේ දැයි නිගමනය කිරීම විගණනයට ඇතුළත් විය. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරි බලතල පැවරේ.

2. ගිණුම්

2.1 ගිණුම් ඉදිරිපත් කිරීම

2002 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ යාපනය විශ්වවිද්‍යාලයේ අවසාන ගිණුම්, 2003 මාර්තු 31 දිනට හෝ ඊට පෙර විගණනය සඳහා ඉදිරිපත් කළයුතු වුවද, විගණනය සඳහා ගිණුම් ඉදිරිපත් කරන ලද්දේ 2003 ජූනි 04 දිනදීය. කෙසේ වුවද 2003 ජූලි 24 දින තෙක් අදාළ උපලේඛන විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණි.

2.2 විගණන මතය

මෙම වාර්තාවේ 2.4 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම් හේතුවෙන් ඇතිවන බලපෑම් හැර, 2002 දෙසැම්බර් 31 දිනට විශ්ව විද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට සහ මූල්‍ය ප්‍රකාශයන්හි දී ඇති සටහන්වල දක්වා ඇති පරිදි වූ ගණකාධිකරණ ප්‍රතිපත්තිවලට අනුකූලව සියළු, ප්‍රමාණාත්මක කරුණු සාධාරණ ලෙස දැක්වෙන පරිදි සතුටුදායක ලෙස මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කර ඇති බව මාගේ මතය වේ.

2.3 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද ගිණුම්වලට අනුව, 2002 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ වැඩ කටයුතුවල ප්‍රතිඵලය රු. 32,49,74,588 ක ඌණතාවයක් වූ අතර, විශ්වවිද්‍යාලයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබුණ රු. 25,00,36,000 ක රජයේ ප්‍රදානය නිසා මෙම ඌණතාවය රු. 7,49,38,588 කට අඩුවිය. මීට අනුරූපී ඉකුත් වර්ෂයේ ඌණතාවය පුනරාවර්තන වියදම් සඳහා වූ රජයේ ප්‍රදානය සැලකිල්ලට ගැනීමට පෙර රු. 30,12,92,658 ක්වූ අතර, පුනරාවර්තන වියදම් සඳහා වූ රු. 24,21,00,000 ක රජයේ ප්‍රදානය නිසා ඌණතාවය රු. 5,91,92,658 කට අඩුවිය.

2.4 ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම

2.4.1 ගිණුම් තැබීමේ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම් තැබීමේ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) කයිතඩි ආයුර්වේද රෝහලෙහි කොන්ත්‍රාත් පදනම යටතේ නැවත සේවයට බඳවා ගන්නා ලද වින්නඹුවන් දෙදෙනෙකුට ගෙවන ලද රු. 60,200 ක මුදල, ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් අයකරගත යුතු මුදලක් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2002.07.01 දින සිට සේවයෙන් ඉවත්වී යාමට අදහස් කරන බවට ලිත් මාසයක දැනුම්දීමක් සිදු නොකළ නිලධාරියකුගෙන් අයවිය යුතු එක් මාසයක වැටුප සහ 2002 ජූනි 11 සිට ජූනි 30 දක්වා කාලය සඳහා වැටුප් රහිත නිවාඩු නිශ්චයකොට ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) නේවාසිකාගාරවල පදිංචි වී සිටින ශිෂ්‍යයන්ගෙන් ගෙවල් කුලී අයකරගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) නිල නිවාසවල පදිංචිව සිටින සමහර අයවලුන්ගෙන් සහ විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලබන කොළඹ සහ යාපනයේ තානායම්වලින් අයකරගත යුතු ගෙවල්කුලී නිශ්චය කොට ගිණුම්වල අනාවරණය කර නොතිබුණි

(ඉ) රසායන විද්‍යා දෙපාර්තමේන්තුවට අනුයුක්ත කථිකාචාර්යවරයෙකුගේ වැටුප් රහිත නිවාඩු දින 08 ක් සඳහා රු. 11,862 ක මුදලක් අයකරගෙන නොතිබුණි.

(ඊ) ඖෂධ දෙපාර්තමේන්තුවෙන් සොරා ගන්නා ලද ඖෂධ ගණනාවක් පිළිබඳ වාර්තාකර නොතිබුණ අතර, ඒවා ගිණුම්වලද ඇතුළත් කර නොතිබුණි.

(උ) අභිවෘද්ධිය ප්‍රාර්ථනා කරන්නන් විසින් යාපනය විශ්වවිද්‍යාලයට පරිත්‍යාග කරන ලද පහත සඳහන් වත්කම් ගිණුම්ගත කර නොතිබුණි.

(i) මලයාසියා-ලංකා සංගමය මගින් පරිත්‍යාග කරන ලද රු. 10,00,000 ක් වටිනා දේපළ

(ii) පුද්ගලයෙකු විසින් පරිත්‍යාග කරන ලද රු. 2,00,000 ක් වටිනා නිවස සහ දේපළ

(iii) රු. 4,00,000 ක් වටිනා තිරුනෙල්වේලි හි පිහිටි ඉඩම.

(ඌ) හමුදා මෙහෙයුම් නිසා කෘෂිකර්ම පීඨයට සිදුවූ හානිය නිශ්චය කොට ගිණුම්ගතකර නොතිබුණි.

(එ) පිළිවෙලින් 1975, 1979 සහ 1980 දී තැන්පත් කරන ලදුව, යාපනයේ දිසා ලේකම් කාර්යාලයේ තිබූ රු. 43,279 ක තැන්පතුව, ගිණුම්වල අනාවරණය කර නොතිබුණි.

(ඒ) ලාස් 3 කුලී 14.39 ක විශාලත්වයෙන් යුතු දේවදාර් කිලික්කුපතී නැමැති පරිත්‍යාග කරන ලද ඉඩම තක්සේරු කොට ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) බැංකු ගිණුමට කරන ලද එකතුව රු. 29,50,267 ක සෘජු බැර ගිණුම්ගත කර නොතිබුණි.

(ඕ) විශ්වවිද්‍යාලය සමග එළඹ තිබූ ගිවිසුම ප්‍රකාර ලිත් මාස තුනක දැනුම්දීමක් නොකළ විශ්වවිද්‍යාලයේ සේවයෙන් ඉවත්වීමට අදහස් කළ තැනැත්තන්ගේ මාස තුනක වැටුප නිශ්චය කොට ගිණුම්ගත කර නොතිබුණි.

(ක) භෞතිකව හරි වැරදි බැලීම සිදු නොකර, පොත් ශේෂය අනුව ස්ථාවර වත්කම් ශේෂ පත්‍රයෙහි දක්වා තිබුණි.

(ග) වවුනියාව මණ්ඩපයට පවරා දී ඇති පුත්තෝට්ටම් හි අක්කර 25 ක රජයේ ඉඩම සහ වවුනියාව පාක්පාරේ අක්කර 1/2 ක ඉඩම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ජ) 2001 පුනරාවර්තන වියදම් සඳහා 2002 ජනවාරි මාසයේදී ප්‍රදානයක් වශයෙන් ලැබුන රු. 10,00,000 ක මුදලක් ප්‍රධාන ලෙජර් ශේෂයට ඇතුළත් කිරීමට පෙර, පොදු සංචිතයේ ආරම්භක ශේෂයෙහි ගැලපුම්කර තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඉකුත් වර්ෂයේ ගැලපුම් යටතේ මෙම ගනුදෙනුව අනාවරණය නොවුණි.

(ට) සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද සමහරක් වාහන සම්බන්ධයෙන් සමාලෝචන වර්ෂය සඳහා ක්ෂය ප්‍රතිපාදන සලසා තිබුණි.

(ඩ) එකතුව රු. 23,699 ක්වූ ඉකුත් වර්ෂයේ වියදම්, සමාලෝචන වර්ෂයේ වියදම් වශයෙන් සලකා තිබුණි.

(න) සැපයුම්කරුවනට අත්තිකාරම් වශයෙන් ගෙවන ලද රු. 5,19,894 ක මුදලක් සමාලෝචන වර්ෂයේ වියදම් වශයෙන් සලකා තිබුණි.

(ත) එකෙකු රු.34.50 ගණනේ කුරුල්ලන් 220 ක් සැපයීම සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට 1993 දී දෙන ලද රු.7,590 ක අත්තිකාරම් මුදල පියවීම ඉකුත් වර්ෂයේ ගැලපුම් යටතේ ගිණුම්ගත කරනවා වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදමක් වශයෙන් සලකා තිබුණි.

(ද) රු.17,849 ක වියදම් සාවද්‍ය අන්දමින් වර්ගීකරණය කොට ගිණුම්වලට වැයභාර කර තිබුණි.

(ණ) වවුනියාව මණ්ඩපයේ ඉකුත් වර්ෂයට අදාල එකතුව රු.47,648 ක වියදම්, සමාලෝචිත වර්ෂයේ වියදම් වශයෙන් සලකා තිබුණි.

2.4.2 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

(අ) ඉකුත් වර්ෂයේ ණයවර ලිපි විවෘත කරන ලද සැපයුම් සඳහා ගෙවූ රු.3,706,683 ක අත්තිකාරම් වලින් රු.1,184,834 ක් වටිනා සැපයුම් 2003 ජූලි 24 දින තෙක් ලැබී නොතිබුණි.

(ආ) රු.136,839 ක් සඳහා වූ ණයවර ලිපි 1999 දී විවෘතකරන ලද නමුත්, අදාල සැපයුම් විශ්වවිද්‍යාලයට ලැබී නොතිබුණි. කෙසේ වුවද, ජාතික ආරක්ෂක බදු වශයෙන් රු.15,662 ක මුදලක් ගෙවා තිබුණි.

(ඇ) පිළිවෙලින් එකතුව රු.259,462,974ක් සහ රු. 17,608,037 ක් වූ ලැබිය යුතු සහ ගෙවිය යුතු මුදල් සම්බන්ධයෙන් සනාථකිරීම් ලබාගෙන නොතිබුණි.

2.4.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

සවිස්තරාත්මක උපලේඛන, සතොක්ෂණ වාර්තා, ඇස්තමේන්තු, මිණුම් වාර්තා, ගුවන් ටිකට්පත්, මිල කැඳවීම්, ධාවන වාර්තා, ඉන්වෙන්ට්‍රි සහතික යානාදිය නොමැතිවීම නිසා එකතුව රු.820,403,738 ක් සඳහා ගිණුම්වල දැක්වෙන විෂයයන් තිස් අටක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

2.4.4 දෘශ්‍යමාන වංචනික ගණුදෙනුව

බැංකුවේ තැන්පත් කරන ලද රු.2,675 ක මුදල 2003 ජූලි 24 දින තෙක් ගිණුමට බැරවී නොතිබුණි.

2.4.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන පනත්, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, චක්‍රලේඛ යනාදියෙහි ප්‍රතිපාදනයන්ට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය
III පරිච්ඡේදයේ 30 වගන්තිය, v පරිච්ඡේදයේ 7.6 සිට 7.6.2 වගන්ති, xvii පරිච්ඡේදයේ 5.2 සහ 9.1 වගන්ති, xx පරිච්ඡේදයේ 5.2, 9.1 වගන්ති සහ 3.1 වගන්තිය xxv පරිච්ඡේදයේ 2.2(එෆ්) වගන්තිය xxvii පරිච්ඡේදයේ 9.4 වගන්තිය.

(ආ) **1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**
71 (1) සහ 71 (2) වගන්ති

(ඇ) **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ චක්‍රලේඛ**

(i) 1980 පෙබරවාරි අංක 63 හි 6(3) වගන්තිය
(ii) 1975 මාර්තු අංක 47 දරන මූල්‍ය සහ සැපයුම් චක්‍රලේඛය
(iii) 2002 ජූනි 13 දිනැති අංක 07/2002 දරන චක්‍රලේඛය

(ඈ) භාණ්ඩාගාර චක්‍රලේඛ

1978 දෙසැම්බර් 19 දින අංක 842, 1979 ජූලි 29 දින අංක 828 සහ 1990 පෙබරවාරි 08 දින අංක 47

(ඉ) මුදල් රෙගුලාසි

අංක 264(1), 570, 571, 700(5), 754 සහ 880

3. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු. 74,938,588 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ ඌණතාවය රු. 59,192,658 ක් වූයෙන් රු.15,745,930 කින් ඌණතාවයේ වැඩිවීමක් පෙන්නුම් කෙරුණි.

3.2 අනාර්ථික ගනුදෙනු

(අ) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ගුදමෙන් නැව්බඩු නිශ්කාශනය කිරීම ප්‍රමාදවීම නිසා, ප්‍රමාද ගාස්තු වශයෙන් රු. 9,554 ක මුදලක් විශ්වවිද්‍යාලය විසින් ගෙවා තිබුණි.
(ආ) එහි භාවිතය සඳහා ඡායා පිටපත් යන්ත්‍රයක් අවශ්‍යවන්නේ ද යන්න සැලකිල්ලට නොගෙන රු.153,450 ක් මිළ වූ ඡායා පිටපත් යන්ත්‍රයක් කොළඹ ගබඩාවට ලබා දී තිබුණි.
(ඇ) රු.218,445 ක් වටිනා ප්‍රමාණවත් තොගයක් වසර පහකට වැඩි කාලයක් ගබඩාවෙහි නිෂ්ක්‍රීයව තිබියදී, 2003 මාර්තු 26 දින රු.9,000 කට දහර බයින්ඩින් ස්ප්‍රින් මිළදී ගෙන තිබුණි.
(ඈ) අඩු පිරිවැයකින් ගොඩබිම මාර්ගයෙහි ගමන් කිරීමට හැකියාව තිබිය දී, කොළඹ සිට යාපනය සහ ආපසු ගමන් කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ සභිකයින් හතර දෙනෙකුට සහ කාර්යමණ්ඩලයේ දාහත් දෙනෙකුට රු.152,423 ක පිරිවැයකින් ගුවන් ගමන් පහසුකම් සමාලෝචිත වර්ෂය තුළ දී සලසා තිබුණි.

3.3 වෙනත් සෙමින් වැයවන, නිෂ්ක්‍රිය සහ ඌණ උපයෝජිත වත්කම්

(අ) 1990 සිට ගිණුම් ක්‍රියාත්මක නොවූ කිලිනොච්චියේ මහජන බැංකුවේ සහ ලංකා බැංකුවේ ජංගම ගිණුම් 2 ක පිළිවෙලින් රු.16,710 ක මුදලක් සහ රු.28,067 ක මුදලක් තිබුණි.

(ආ) රු. 10,467 ක් වටිනා ඖෂධ වර්ග අටක් කල් ඉකුත්වීමට පෙර භාවිතයට නොගෙන අවුරුදු එකේ සිට දෙක දක්වා කාලයක් තුළ සෞඛ්‍ය මධ්‍යස්ථානයෙහි තිබුණි.

(ඇ) මොනිටර් 17 ක්, සී. පී. යූ. 15 ක්, මයික්‍රෝ නෙට්වර්ක් හබ් 01 ක්, ස්කැනර් 01ක්, ප්‍රින්ටර් 01, ක් සහ සර්වර් 01 ක් අළුත්වැඩියා නොකර දිගුකලක් තිස්සේ පරිගණක ඒකකයෙහි තිබුණි. මෙම අයිතමයන් අළුත්වැඩියාකර භාවිතයට ගැනීමට හෝ ඒවා විකුණා දැමීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඇ) පිළිවෙලින් රු.170,000 කට හා රු.12,400 කට 2002 වර්ෂයේ දී මිලදී ගන්නා ලද වේලා සටහන් යන්ත්‍ර පහක් සහ ඒවාට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය, අදාල කාර්ය සඳහා භාවිතයට ගෙන නොතිබුණ අතර, ඒවා විශ්වවිද්‍යාලයේ ආයතන ඒකකයේ නිෂ්ක්‍රීය ව තිබුණි.

(ඉ) රු28,793 ක් වටිනා හුණුකුරු පෙට්ටි 1053 ක් දීර්ඝ කාලයක් තිස්සේ ගබඩාවෙහි තිබුණි.

(ඊ) 2000 අගෝස්තු මාසයේදී රු.18,415 කට මිල දී ගන්නා ලද වර්ඩ් ප්‍රොසෙසර් රිබන් 146 ක් භාවිතයට නොගෙන 2003 ජූලි 24 තෙක් ගබඩාවෙහි තිබුණි.

(උ) පරපෝෂිත විද්‍යා දෙපාර්තමේන්තුවෙහි බරකිරණ තරාදිය අළුත්වැඩියා නොකිරීම නිසා අවුරුදු පහකට අධික කාලයක් තුළ භාවිතයට ගෙන නොතිබුණි.

(ඌ) විද්‍යුත් හෘද බද්ධය, තරාදිය, සයිකලය, දෘෂ්‍ය මාපකය, සහ කාබන්ඩයොක් සයිඩ් පරීක්ෂකය වැනි ශාරීරික විද්‍යා දෙපාර්තමේන්තුවේ රසායානාගාර උපකරණ අළුත්වැඩියා නොකිරීම නිසා අවුරුද්දේ සිට අවුරුදු දෙක දක්වා වූ කාලයක් තුළ නිෂ්ක්‍රීයව තිබුණි.

(ඒ) රු. 1,027,000 ක් වටිනා රසයනාගාර උපකරණ 11 ක් අළුත්වැඩියා නොකිරීම නිසා අවුරුද්දකට වැඩි කාලයක් රසායන විද්‍යා දෙපාර්තමේන්තුවෙහි නිෂ්ක්‍රීයව තිබුණි.

3.4 හඳුනාගන්නා ලද පාඩු

(අ) ගබඩාවෙහි තිබූ රු.4,500 ක් වටිනා සිමෙන්ති බෑග් 10 ක් පාවිච්චියට නුසුදුසු විය.

(ආ) රු.8,505 ක් වටිනා ආර්ජේ 45 රැළිදමන මෙවලම් 2 ක් අස්ථාන ගතවී තිබුණි.

3.5 ව්‍යාපෘති ප්‍රමාදයන්

(අ) 1981 තරම් ඈත කාලයේදී ගිවිසුම්වලට එළඹ තිබුණු විවිධ ව්‍යාපෘති යටතේ වූ ඉදිකිරීම් නිමකර නොතිබුණි.

(ආ) වෛද්‍ය පීඨයේ ශ්‍රවණාගාරය අලංකාර කිරීම සඳහා එක්තරා සමාගමකට උපදේශක ගාස්තු වශයෙන් 2002 ජූලි මාසයේදී රු. 126,973 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද, ශ්‍රවාණාගාරය අලංකාර කිරීමට අදාල කටයුතු මෙතෙක් ආරම්භ කර නොතිබුණි.

3.6 වත්කම් නිසි පරිදි නඩත්තු නොකිරීම

විශ්වවිද්‍යාලයේ ඉඩම් සහ ගොඩනැගිලි නඩත්තු කිරීම සඳහා රු.6,803,452 ක මුදලක් වැයකර තිබුනද, විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය මධ්‍යස්ථානය නිසි පරිදි නඩත්තු කර නොතිබුණ අතර, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කරවීම සඳහා යෝග්‍ය පහසුකම් සෞඛ්‍ය මධ්‍යස්ථානයට සපයා නොතිබුණි.

3.7 අදාල නොවන වියදම් විෂයයන්

(අ) 2003 දෙසැම්බර් 13 වන දින ශ්‍රී පරමේෂ්වරන් කෝවිලෙහි පවත්වන ලද ශ්‍රී පොන්නම්බලම් රාමනාදන් ගුරු පූජාව සඳහා දරන ලද රු. 10,000 ක වියදම් වෙනත් පුනාරාවර්තන වියදම් වශයෙන් සලකා තිබුණි.

(ආ) වෛද්‍ය පීඨයේ ශිෂ්‍යයකුගේ අවමංගල්‍ය සඳහා රු.39,500 ක මුදලක් වැයකර තිබුණි.

3.8 කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

(අ) මහාභාණ්ඩාගාරයේ සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා නොගෙන කාර්ය පැවරුම් පදනම මත පුරප්පාඩු තනතුරු සඳහා පත්කිරීම් සිදු කිරීම විශ්වවිද්‍යාලයේ නිත්‍ය ලක්ෂණයක් වී ඇත. අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ හත් දෙනෙකුද ඇතුළුව විශ්වවිද්‍යාල සේවයෙන් විශ්‍රාමගිය නිලධාරීන් දහතුන් දෙනෙකු භාණ්ඩාගාරයේ සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව කාර්ය පැවරුම් මත පත්කර, වැටුප් වශයෙන් රු. 1,346,571 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ දේශන පැවැත්වීමට සහ වෘත්තියෙහි නියැලීම වෙනුවෙන්, භාණ්ඩාගාරයේ සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියක් නොමැතිව සහ දිනකට සේවය කරන ලද කාලය සැලකිල්ලට නොගෙන, යාපනයේ ශික්ෂණ රෝහලට අනුයුක්ත වෛද්‍යවරුන්ට ඔවුන්ගේ මාසික වැටුපට සමාන ප්‍රසාද මුදලක් කෙලින්ම ගෙවා තිබුණි. මේ අනුව මෙකී වෛද්‍යවරු ආයතන දෙකකින් වැටුප් ලබා ගනිති.

මාසික වැටුපට සමාන ප්‍රසාද මුදලක් කෙලින්ම ගෙවා තිබුණි. මේ අනුව මෙකී වෛද්‍යවරු ආයතන දෙකකින් වැටුප් ලබා ගනිති.

3.9 නිශ්චිත අරමුදල් යෙදවීම

නිශ්චිත කාර්යයන් සඳහා ලැබුණ එකතුව රු.20,482,939 ක් වූ ප්‍රදාන සහ ඒමත ලැබුණ එකතුව රු. 2,391,830 ක් වූ පොලිය, එකී මුදල් ලබාදුන් කාර්යයන් සඳහා උපයෝගීකර ගෙන නොතිබුණි.

3.10 සේවකයන්ගේ පාරිතෝෂික ගෙවීම සඳහා අරමුදල් යෙදවීමේ වැඩ පිළිවෙල

විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට පාරිතෝෂික ගෙවීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට රු. 69,851,773 ක මුදලක් ප්‍රතිපාදනය කර තිබුණි. නමුත්, බැරකම් පැනනගින අවස්ථාවල දී පියවීම පිණිස අරමුදලක් පිහිටුවා නොතිබුණි.

3.11 අයවැය පාලනය

අයවැය ලේඛනය සහ තථ්‍යය අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ හෙයින්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදවාගෙන නොතිබුණු බව දක්නට ලැබුණි.

4. පද්ධති හා පාලන

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු, මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර 2003 ජූලි 24 දින ඉදිරිපත් කරන ලද මාගේ විස්තරාත්මක වාර්තාව මගින් විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත දක්වන පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) කාර්ය මණ්ඩලයට බඳවා ගැනීම
(ආ) ස්ථාවර වත්කම්
(ඇ) ණයකරුවන්
(ඈ) අත්තිකාරම්
(ඉ) මිලදී ගැනීම්
(ඊ) පාඩු
(උ) අයවැය
(ඌ) කොන්ත්‍රාත් පරිපාලනය
(එ) තොග
(ඒ) පරිත්‍යාග අරමුදල
(ඔ) අභ්‍යන්තර විගණනය

(එස්. සී. මායාදුන්නේ),
විගණකාධිපති.

විගණකාධිපති සටහන

යාපනය විශ්වවිද්‍යාලයේ 2002 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (i) හා iii වගන්ති සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) සහ (7) උපවගන්ති සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණන කරන ලදී.

මෙම ගිණුම් පිළිබඳ මාගේ නිරීක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ උපකුලපති අමතන ලද සම දින දරන මාගේ වාර්තාවේ ඇතුළත්ව ඇත.

(එස්. සී. මායදුන්නේ),
විගණකාධිපති,

2003 අගෝස්තු මස 21 දින,
කොළඹ 07, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ දී ය.

**2002.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා යාපනය විශ්වවිද්‍යාලයේ ගිණුම් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව ගැන යාපනය විශ්ව විද්‍යාලයේ පාලන බලධාරියාගේ නිරීක්ෂණ**

2.4.1 (අ) රු. 60,200/12 ක මුදල ණයගැතියන් වශයෙන් පෙන්නුම් කොට 2002 ගිණුම්වල උපලේඛනයෙහි ඇතුළත් කරන ලදී.

(ආ) විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේ කටයුතු අවසන් කරන අවස්ථාවේ ලැබිය යුතු සියලුම මුදල් ගිණුම් ගත කරනු ලැබේ.

(ඈ) ශිෂ්‍යයන් විසින් ගෙවනු ලබන කුලිය ගිණුම්වල පෙන්නුම් කර තිබෙන අතර අය කළ යුතු මුදල ලැබිය යුතු මුදල වශයෙන් දක්වා තිබේ.

(ඇ) ආගන්තුක නිවාසයේ සහ විශ්වවිද්‍යාලයීය නිවාසවල පදිංචි අයගෙන් ලැබුණු කුලිය ගිණුම්වල පෙන්නුම් කර ඇති අතර අයවිය යුතු මුදල් ලැබිය යුතු මුදල් වශයෙන් පෙන්නුම් කර තිබේ.

(ඉ) මේ මුදල 2003 වර්ෂයේ දී අය කර ගෙන තිබේ.

(ඊ) මේ කාරණය ගැන කරුණු සොයා බලා ගෙන යනු ලැබේ.

(උ) මේවා 2003 වර්ෂයේ ගිණුම්ගත කර තිබේ.

(ඌ) 2004 වර්ෂයේ දී ගිණුම්ගත කරනු පිණිස පාඩුවේ ප්‍රමාණය ලබා ගනු පිණිස පියවර ගෙන තිබේ.

(එ) ලියකියවිලි සොයා ගැනීමට කාලය අවශ්‍ය වන හෙයින් යථා කාලයේ දී මේ ගැන පියවර ගනු ලැබේ.

(ඒ) 2003 වර්ෂයේ දී මෙය ගිණුම්ගත කර ඇත.

(ඔ) සියලුම සෘජු ණය හඳුනා ගෙන ඇති අතර 2003 වර්ෂයේ දී ගිණුම්ගත කර ඇත.

(ඕ) දැනුම්දීම වෙනුවට වැටුප් ගෙවීම විශ්ව විද්‍යාලයීය අර්ථසාධක අරමුදලින් කළ යුතු ගෙවීමක් වශයෙන්, එම අරමුදල් කටයුතු අවසන් කරන අවස්ථාවේ දී පෙන්වා ඇත.

(ඖ) බඩුබාහිර සමීක්ෂණ කලට වේලාවට සම්පූර්ණ කිරීමට පියවර ගනු ලැබේ.

(ඖ) මෙම ඉඩම්වල වටිනාකම 2002 දී ගිණුම් ගත කර තිබේ.

(ක) පොදු සංචිතයට කෙරෙන ගැලපුම් මින් ඉදිරියට ආදායම් සහ වියදම් විසර්ජන ගිණුමෙහි වෙනම පෙන්වනු ඇත.

(ග) ගැලපුම් 2003 ගිණුම්වල සිදු කර ඇත.

(ජ) අවශ්‍ය ගැලපුම් 2003 වර්ෂය තුළ කර තිබෙන අතර කලින් වර්ෂය සම්බන්ධයෙන් වූ වියදම් සියල්ල, උපචිත වියදම් වශයෙන් ගිණුම්ගත කර නැත්නම් කලින් වර්ෂයේ ගෙවීම් වශයෙන් පෙන්නුම් කරනු ලැබේ.

(r, s, t, n) මෙබඳු වැරදි, ඉදිරියේදී ඇති නොවීමට වග බලා ගනු ඇත.

2.4.2 (අ) සැපයුම්කරුගේ ඉල්ලීමට අනුව, අදාළ දෙපාර්තමේන්තුවේද කැමැත්ත ලබා ගැනීමෙන් පසු නැව්ගත කිරීමේ දින දීර්ඝ කරන ලදී.

(ආ) 2002 දී ඉදිරිපත් කරන ලද ඇණවුම් බොහෝ ප්‍රමාණයක් 2003 වර්ෂයේදී ඉටු කර තිබේ.

(ඇ) ලැබිය යුතු සහ ගෙවිය යුතු මුදල් සඳහා තහවුරු කිරීම් ලබා ගැනීමට පියවර ගෙන තිබේ.

2.4.3 රු. 820,403,738 ක් වූ මුදල පිළිබඳ විස්තර නොමැති නිසා මෙම විමසුමට පිළිතුරු සැපයීම නොහැකිවී තිබේ.

2.4.4 බැංකු ගිණුම්වලට කෙරෙන තැන්පතු සියල්ල හඳුනා ගෙන 2003 වර්ෂයේදී ගිණුම්ගත කර තිබේ.

2.4.5 විශ්වවිද්‍යාල පනත, ආයතන සංග්‍රහය සහ චක්‍රලේඛ ආදිය අනුව ක්‍රියාකිරීමට හැම පියවරක්ම ගනු ලැබේ.

3.2 (a) ප්‍රමාදයකින් තොරව නැව්බඩු නිශ්කාශනය කිරීමට පියවර ගෙන ඇත.

(b) කොළඹ දී ඡායාපිටපත් ගැනීමට විශාල මුදලක් වැය කිරීමට විශ්වවිද්‍යාලයට සිදුවූ හෙයින් ද ප්‍රමද වීම් වැළැක්වීමේ අදහසින් ද කොළඹ ගබඩාවට ඡායාපිටපත් යන්ත්‍රයක් සපයන ලදී.

(c) මිල දී ගත් විශාලත්ව ප්‍රමාණය ගබඩාවේ නොතිබිණි.

(d) යාපනය විශ්වවිද්‍යාලයට ලැබී ඇත්තේ වාහන තුනක් පමණි. මෝටර් රථය උපකුලපතිවරයාට පවරා ඇත. වෑන් රථය වෛද්‍ය පීඨයට දී තිබේ. පොදු කටයුතු සඳහා හවුලේ පාවිච්චි කිරීමට ඇත්තේ පික්අප් රථය පමණි. එහෙයින් නිලකටයුතු සඳහා කොළඹට එන පීඨාධිපතිවරුන්ට,

ලේඛකාධිකාරිට, පුස්තකාලයාධිපතිට සහ මුදල් භාරකරුට වාහන ලබා දීමට හැකියාවක් නැත. තවද යාපනයට දුම්රිය සේවයක්ද නැත. විශ්ව විද්‍යාල නිලධාරීන්ට සැතපුම් කුලිය ලබා ගැනීමේ හිමිකම් තිබේ. සැතපුම් කුලිය වශයෙන් ගෙවිය යුතු මුදල හා සසඳන විට ගුවන් ගමන් ගාස්තු වැඩි වන්නේ ස්වල්ප මුදලකින් පමණි. එහෙයින් කඩිනම් ස්වභාවය සලකා බලා එක් එක් අවස්ථාව වෙන වෙනම විමසා බැලීමෙන් පසු ගුවන් ගමන් අනුමත කිරීමේ බලය විශ්වවිද්‍යාල සභාව උපකුලපතිවරයාට පැවරුවේය.

3.3 (a) මෙම ගිණුම් දෙක වසා දැමීමට පියවර ගෙන තිබේ.

(b) කල් ඉකුත් වූ ඖෂධ වල වටිනාකම රු.3356.06 ක් මිස විගණන වාර්තාවේ සඳහන් පරිදි රු. 10,467 ක් නොවේ. මෙම ඖෂධවල කාලය ඉකුත් වී ඇත්තේ 2000 සිට 2002 දක්වා අවුරුදු තුන තුළ දී ය.

(c) උපකරණ අලුත්වැඩියා කර ගැනීමට පියවර ගෙන තිබේ.

(d) ටයිම් රෙකෝඩරය ඉදිරිපත් කිරීමට එරෙහිව මෙම විශ්වවිද්‍යාලයීය සේවකයන් විරුද්ධත්වය ප්‍රකාශ කර ඇති බැවින් ටයිම් රෙකෝඩරය ඉදිරිපත් කිරීමේ කාර්යය කල් දැමීමට විශ්වවිද්‍යාල පරිපාලනයට සිදු විය.

(e) මෙම භාණ්ඩ ගබඩාවෙන් නිකුත් කර ඇති අතර වර්තමාන තොග ශේෂය පෙට්ටි 678 ක් වේ.

(f) පරිගණක භාවිතය නිසා වදන් පිරිසැකසුම් (Word Processor) භාවිතය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වූ නිසා එම උපකරණය සඳහා රිබන් පටි ලබා ගැනීමේ අවශ්‍යතාවය අඩු විය.

(g) යන්ත්‍රය මෙහිදී අලුත්වැඩියා කිරීම සඳහා නිපුණ පුද්ගලයන්/ආයතන සොයා ගැනීම ඉතා දුෂ්කරය.

(h) මෙම උපකරණ අලුත්වැඩියා කිරීම සඳහා කොළඹට යැවීමට පියවර ගනු ලැබේ.

(i) වාර්තාවේ සඳහන් භාණ්ඩ රසායන විද්‍යා අංශයට අයත් ඒවා නොවන බව එහි ප්‍රධානියා වාර්තා කර තිබේ.

3.4 (a) වැලි ලබා ගත නොහැකි වූ බැවින් සිමෙන්ති පාවිච්චි කළ නොහැකි විය.

(b) රු. 8505 ක් වූ මුදල, 2003.09.27 දින පැවති 278 වැනි විශ්වවිද්‍යාල පාලක සභා රැස්වීමේ දී අනුමැතිය ඇතිව කපා හරින ලදී.

3.5(a) 1981 දී ගිවිසුම් අත්සන් කළා වූ ද 2002.12.31 දින වැඩ අවසන් නොකළ, වූ ද ව්‍යාපෘති කිසිවක් නැත.

(b) 2002 වර්ෂය සඳහා වෙන් කළ මුදල් ප්‍රමාණවත් නොවූ බැවින් මේ කාර්යය 2002 වර්ෂයේදී ආරම්භ කළ නොහැකි විය.

3.6 සෞඛ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ව්‍යුහමය වශයෙන් ආරක්ෂා සහිත වන අතර 2002 වර්ෂයේ දී එහි දෝෂ කිසිවක් දිස් වූයේ නැත. ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය කිරීම සඳහා වෙන් කළ වාර්ෂික මුදල, බලාපොරොත්තු වූ උසස්ම ආකාරයෙන් විශ්වවිද්‍යාල ගොඩනැගිලි වැඩි දියුණු කිරීම සඳහා ප්‍රමාණවත් නොවීය.

3.7 (a) හා (b) මේ ආකාරයේ වියදම් ඉදිරි කාලයේ දී වළක්වනු ලැබේ.

3.8 අපේ දැන්වීම් නැවත නැවත පළ කළ නමුත් වෛද්‍ය සහ විද්‍යා පීඨවල ජ්‍යෙෂ්ඨ අධ්‍යාපන ශ්‍රේණිවල තනතුරුවලට සුදුසුකම් සහිත පුද්ගලයෝ ඉල්ලුම් නොකළහ. එහෙයින් සේවයෙන් විශ්‍රාම ගෙන සිටි 6 දෙනෙකු ජ්‍යෙෂ්ඨ ආචාර්ය මණ්ඩලයට නැවත සේවයේ යොදවා ගැනීමට විශ්ව විද්‍යාල සභාව තීරණය කළේය. මේ අතර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබෙන තෙක් අතුරු පිළියමක් වශයෙන් එකවර ගෙවන මුදලක් තම පදනම් ව පැවරුම් මත මෙම ආචාර්ය මණ්ඩලය පත් කිරීමට ද විශ්ව විද්‍යාල සභාව තීරණය කළේය. එසේ කළේ මේ පීඨවල සුදුසුකම් ලත් ජ්‍යෙෂ්ඨ හා පළපුරුදු පුද්ගලයින්ගේ හිඟය නිසා පැවැත්විය නොහැකි වූ පාඨමාලා පවත්වා ගෙන යාම සඳහාය .

3.9 නියමිත මුදලක් ගෙවීම මත රෝහල් උපදේශකවරුන් පත් කිරීම අවලංගු කොට පැය ගණනට ගෙවීමේ පදනම මත බාහිර පත්වීම් මගින් එම වැඩ ආවරණය කැරිණි.

3.10 පාරිතෝෂික ලබා දීම සඳහා අවශ්‍ය මුදල් වෙන් කිරීම භාණ්ඩාගාරය ලබා නොදෙයි.

සකස් කළ අය : මූල්‍යාධිකාරී.

06-483

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : කේ4/3515/කේඑන්1/102.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2002.05.13 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එම්. කේ. එල්. බී. විජේකෝන් විසින් සහතික කරන ලද 1999.09.27 දිනැති අංක 1986 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, වැරැල්ලගම පදිංචි රන්කොත් ගෙදර විමලසේන යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2002.03.05 වැනි දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හැත්තෑ හයදහස් අටසිය තිහයි ශත දහඅට (රු. 76,830.18) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 1986 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් විසිනවයයි ශත තිස් එක (රු. 29.31) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කටුගස්තොට, කහල්ල අංක 26බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

මහනුවර දිස්ත්‍රික්කයේ, කිරිමැටිය පිහිටි එඩරුගලවත්ත නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජී. එස්. පී. ලෙනගල්ල විසින් සැකසූන 1994.04.04 සහ 1998.05.25 දිනැති හා අංක 611ඒ දරන මිණුම් පිඹුරේ කැබලි අංක 1 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 12.34 ක් වූ ඉඩම සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

තවද බලයලත් මිනින්දෝරු ජී. එස්. පී. ලෙනගල විසින් සැකසුණු 1994.04.04 දිනැති හා අංක 611 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 45, 46, 47, 48, 49 සහ 50 මතින් ඇති ජලය ගලායෑම සඳහා ඇති අයිතිය ද,

බලයලත් මිනින්දෝරු ජී. එස්. පී. ලෙනගල විසින් සැකසුණු 1994.04.04 සහ 1994.04.26 දිනැති අංක 611 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 44ඒ, 44බී, 44සී, 44ඩී සහ 52 මතින් අම්පිටිය-ගුරුදෙණිය ප්‍රධාන මාර්ගයේ සිට දිවෙන මාර්ග අයිතිය ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජූනි මස 02 වැනි දින,
ගාලු පාරේ, අංක 269,
කොළඹ 03.

06-475/1

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : කේ5/5099/කේඑන්1/209.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.02.20 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එන්. බී. ඒ. පී. බලල්ල විසින් සහතික කරන ලද 2001.12.16 දිනැති අංක 2679 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, අකුරම්බොඩ පදිංචි පල්දෙනියලැගෙදර ප්‍රියන්ත සිසිර කුමාර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.01.09 වැනි දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හැත්තෑ පන්දහස් හතලිස් අටයි ශත හැත්තෑ හත (රු. 75,048.77) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 2679 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් විසිහතරයි ශත දහය (රු. 24.10) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කටුගස්තොට, කහල්ල අංක 26බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

මාතලේ දිස්ත්‍රික්කයේ, පල්ලෙපොල ප්‍රාදේශීය සභා සීමාවේ කිරිඔරුව ග්‍රාමයේ පිහිටි ගොරකගහකොටුව කඹුරේපිල්ලැව දැන් වත්ත නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. එම්. එස්. හේරත් විසින් සකසන ලද 2001.05.07 දිනැති හා අංක 5729 දරන පිඹුරේ කැබලි අංක 2 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 11.5ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

තවද එකී පිඹුරේ කැබලි අංක 3 (අඩි 20 පාරක් සඳහා) කැබලි අංක 13 සහ කැබලි අංක 17 (අඩි 16 පළල පාර සඳහා) මතින් ඇති මාර්ග අයිතිය ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජූනි මස 02 වැනි දින,
ගාලු පාරේ, අංක 269,
කොළඹ 03.

06-475/4

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 5/73828/ඩී5/717.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.02.20 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් එම්. වයි. එම්. තව්ෆික් විසින් සහතික කරන ලද 2000.01.17 දින හා අංක 3971 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, ගලේවෙල පදිංචි පහළ ගෙදර කිවිතුංග යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.01.09 වැනි දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හාරලක්ෂ හතලිස් හත්දහස් එකසිය අසූදෙකයි ශත පනස් තුන (රු. 4,47,182.53)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 3971 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය තිස්හතරයි ශත අනූ එක (රු. 134.91)ක් බැගින් වැඩිපුර පොලිය ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කටුගස්තොට, කහල්ල අංක 26බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

#### උපලේඛනය

මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ දඹගොල්ල ග්‍රාමයේ පිහිටි මාරගස්යායේ වත්ත නමැති ඉඩමේ එල්. සිරිපාල බලයලත් මානක තැන විසින් සැකසුණු 1998.12.09 වැනි දින සහ අංක 250ඒ දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 1, රූ. 2, පර්. 0කින් යුත් බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඊට අයිති සියලු දේත් වේ.

තවද එකී පිඹුරේ පෙන්නුම් කරන ලද මාර්ග අයිතීන් ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජූනි මස 02 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

06-475/14

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 2/63533/කිව්2/840, 67326/ඊ2/237.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2003.04.29 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. කහවේවිතාරන විසින් සහතික කරන ලද 1998.01.02 දින හා 1999.05.23 දින අංක 7920 සහ 9211 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, සීදුව පදිංචි අශෝක සුදර්මන් නාගසිංහ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2003.03.25 වැනි දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් තුන්ලක්ෂ පහළොස් දහස් හත්සිය හැටපහයි ශත පනස්නවය (රු. 3,15,765.59)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 7920, 9211 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය තිහයි ශත හැත්තෑ හය (රු. 130.76)ක් බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, ගම්පහ, උසාවිය පාර, ස. ණ. ස. චතුරශ්‍රය, අංක 15හි බලයලත් වෙන්දේසිකාර ටී. එම්. එස්. පීරිස් මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

#### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කාර්යාල සීමාව තුළ සීදුව-කටුනායක නගර සභාවට අයත් වරිපනම් අංක 109, අමුණ පාර. බණ්ඩාරවත්ත පිහිටි කහටගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. පෙරේරා විසින් සකසන ලද 1991.12.04 දින සහ අංක 1864/ඩී දරන පිඹුරේ කැබලි අංක 4 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 13.5ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

තවද, එකී පිඹුරු අංක 1864/ඩී හි සඳහන් කැබලි අංක 7 මතින් ඇති මාර්ග අයිතීන්ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජූනි මස 02 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

06-475/3

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : ජීපී/02/00673/සී2/564.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.01.31 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. එස්. කේ. ජයසේකර විසින් සහතික කරන ලද 2001.06.11 දින හා අංක 776 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, බුලත්පිටිය පදිංචි කුරුකුලසූරිය කොන්තකොන්තේරු කොන්තම්බිරාලලාගේ ප්‍රියංකා කුරුකුලසූරිය යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2005.12.31 වැනි දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හැටපන්දහස් දෙසිය හැත්තෑ එකයි ශත පනස් නවය (රු. 65,271.69)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 776 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් විසි හතරයි ශත අසූ හත (රු. 24.87)ක් බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, ගම්පහ, උසාවිය පාර, ස. ණ. ස. චතුරශ්‍රය, අංක 15හි බලයලත් වෙන්දේසිකාර ටී. එම්. එස්. පීරිස් මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොයිගම ග්‍රාමයේ පිහිටා ඇති ඇටඹගහලන්දපිල්ලැව *නොහොත්* ඇටඹගහලන්ද නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ. පී. වික්‍රමසිංහ විසින් 2000.03.18 දින සකසන ලද අංක 1082 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 17 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 15ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඊට අයිති සියලු දේත් සමඟ වේ.

තවද, එකී පිඹුරේ සඳහන් මාර්ග අයිතීන් ද සමඟ ඒ. ඩී. ඒ. සේනානායක බලයලත් මානක තැනගේ අංක 138 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 6 සහ 7 මතින් දක්වා ඇති මාර්ග අයිතීන් ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජුනි මස 02 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

06-475/16

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 12/73606/ඩී12/288.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2004.09.23 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් වී. කේ. එස්. සුබ්‍රමනියම් විසින් සහතික කරන ලද 2002.09.27 දින හා අංක 3017 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, පස්සර, පදිංචි රත්නායක මුදියන්සේලාගේ චන්ද්‍රවතී සහ මානවඩුගේ සරත් සෝමසිරි ගුණවර්ධන යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2004.09.01 වැනි දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හාරලක්ෂ හතලිස් දෙදහස් පන්සිය හැත්තෑ හතරයි ශත අනූතුන (රු. 4,42,574.93)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 3017 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය අසූ නවයයි ශත හතර (රු. 189.04) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, බදුල්ල, කළුගල්පිටිය, අංක 48/1හි බලයලත් වෙන්දේසිකාර ඩබ්. ජයතිලක මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

බදුල්ල දිස්ත්‍රික්කයේ, පස්සර ප්‍රාදේශීය සභා සීමාව තුළ කනහෙල ග්‍රාමයේ පිහිටි අලුත්වෙල කහටදණ්ඩෙකුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. සමරක්කොඩි විසින් සකසන ලද 1996.07.09 දිනැති වශයෙන් වැරදීමකින් 1998.07.09 ලෙස ලියාපදිංචි කරන ලද අංක 2490 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 16.57ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස හා ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

තවද, එකී අංක 2490 දරන පිඹුරේ වෙන් කර ඇති මාර්ග අයිතිය ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජුනි මස 02 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

06-475/8

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 6/45053/එෆ්6/123.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.03.09 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. පානදුර ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඒ. කරුණාසේන විසින් සහතික කරන ලද 2003.03.23 දින හා අංක 3834 දරන උකස් බැදුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, වාද්දුව පදිංචි හෙට්ටියකන්දගේ ටිරන් සාන්තසිරි ප්‍රනාන්දු සහ ඩිලන්ති බර්නදෙත් ගෝමස් යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.02.25 වැනි දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් තුන්ලක්ෂ පනස් අටදහස් හත්සිය දාසයයි ශත හැත්තෑ අට (රු. 3,58,716.78)ක මුදලක් ද, පූර්වෝක්ත බැදුම්කර අංක 3834 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය දහහතයි ශත දහතුන (රු. 117.13) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පානදුර, ඩයස් ගොඩනැගිල්ලේහි බලයලත් වෙන්දේසිකාර එච්. ගිල්ටන් පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

#### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණු වාද්දු වස්කඩු දෙබැද්ද පානදුර ප්‍රාදේශීය සභා සීමාවේ (වාද්දුව උප කාර්යාලය) මොල්ලිගොඩ පිහිටි කරඳගහවත්ත *නොහොත්මුදිල්ලගහවත්ත* නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ. එම්. ආර්. ජයසේකර විසින් සකසන ලද 2002.04.18 දිනැති හා අංක 2833 දරන පිඹුරේ කැබලි අංක සී ලෙසින් දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 12ක් වූ බෙදා වෙන් කල බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජුනි මස 02 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

06-475/9

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 10/61337/ඩී10/402..

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.03.09 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. හම්බන්තොට ප්‍රසිද්ධ නොතාරිස් ටී. එම්. ෆාරුක් විසින් සහතික කරන ලද 1997.09.01 දින හා අංක 1454 දරන උකස් බැදුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, අම්බලන්තොට පදිංචි කළුහෙන්නැදිගේ චන්ද්‍රකාන්ති යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.02.25 වැනි දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ විසිඑක් දහස් තුන්සිය අසූ හතයි ශත අනූනවය (රු. 2,21,387.99)ක මුදලක් ද, පූර්වෝක්ත බැදුම්කර අංක 1454 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් පනස් පහයි ශත අනූහත (රු. 55.97)ක් බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කොළඹ 12, අලුත්කඩේ වීදිය, අංක 99, සේන හෝල්ඩින්ග්ස් (පුද්.) සමාගමෙහි බලයලත් වෙන්දේසිකාර ටී. සී. සේනානායක මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

#### උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තවාලුවිල ග්‍රාමයේ පිහිටි ජුල්ගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඊ. එම්. ප්‍රේමසිරි විසින් සකසන ලද 1996.07.30 දින සහ අංක 269 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 1, පර්. 0ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජුනි මස 02 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

06-475/10

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 10/54941/ඩී10/214.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.01.31 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. හම්බන්තොට ප්‍රසිද්ධ නොතාරිස් ටී. එම්. ෆාරුක් විසින් සහතික කරන ලද 1994.09.27 දින හා අංක 1025 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, අම්බලන්තොට පදිංචි ලියනගේ දොන් සමරජීව යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2005.12.31 වැනි දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් තුන් ලක්ෂ එකොලොස් දහස් පනස් තුනයි ශත විසිහය (රු. 3,11,053.26)ක් මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 1025 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් හැත්තෑ අටයි ශත පනස් අට (රු. 78.58) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කොළඹ 12, අලුත්කඩේ වීදිය, අංක 99, සේන හෝල්ඩින්ග්ස් (පුද්.) සමාගමෙහි බලයලත් වෙන්දේසිකාර ටී. සී. සේනානායක මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩබෙරගම ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ, උඩබෙරගම ග්‍රාමයේ පිහිටි ඉහිනියන්ගස්ලන්ද නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. රංචාගොඩ විසින් මැන සකසන ලද 1993.10.18 දින සහ අංක 4025 දරන පිඹුරේ කැබලි අංක 3 (අයි. එස්. පී. පී. 08 දරන පිඹුරේ කැබලි අංක 57 සහ 58) ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 2, පර්. 0ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

තවද එකී අංක 4025 දරන පිඹුරේ කැබලි අංක 07 (ප්‍රවේශ මාර්ගයක් සඳහා වෙන් කරන ලද බිම් තීරුව) මතින් ඇති මාර්ග අයිතිය ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජූනි මස 02 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

06-475/2

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 10/61334/ඩී10/358.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2004.07.23 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. හම්බන්තොට ප්‍රසිද්ධ නොතාරිස් ටී. එම්. ෆාරුක් විසින් සහතික කරන ලද 1997.03.05 දින හා අංක 1340 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, අම්බලන්තොට පදිංචි හොරේමුල්ලගේ නන්දසේන යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2004.06.30 වැනි දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් අසූහතරදහස් හයසිය හතළිහයි ශත පහළොව (රු. 84,640.15)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 1340 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් තිස්තුනයි ශත දොළහ (රු. 33.12)ක් බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, ගම්පහ, උසාවිය පාර, ස. ණ. ස. චතුරශ්‍රය, අංක 15හි බලයලත් වෙන්දේසිකාර ටී. එම්. එස්. පීරිස් මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට දිස්ත්‍රික් ආදායම් නිළධාරී කොට්ඨාසයේ වදුරුප්ප ග්‍රාමසේවා වසමේ වදුරුප්ප ග්‍රාමයේ පිහිටි මෝදරවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. රංචාගොඩ විසින් 1996.10.15 දින සකසන ලද අංක 4433 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 1 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 1, රූ. 0., පර්. 0ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජූනි මස 02 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

06-475/15

## මහජන බැංකුව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2004.09.29 වන දින පැවති රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී, එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2001.06.19 දිනැති අංක 6077 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් ඉලංගකෝන් ආරච්චිලාගේ චමින්ද ඉලංගකෝන් යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් එක්ලක්ෂ අසූඑක්දහස් තුන්සිය හැත්තෑ අටයි ශත විසිහය (රු. 181,378.26) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින්ද, 2003.09.05 දින සිට වර්ෂයකට 29%ක් බැගින් රුපියල් එක්ලක්ෂ අසූඑක්දහස් තුන්සිය හැත්තෑඅටයි ශත විසිහය (රු. 181378.26) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29 එල් 'වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තුද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් එක්ලක්ෂ අසූඑක්දහස් තුන්සිය හැත්තෑ අටයි ශත විසිහය (රු. 181,378.26) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 6077 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරි ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපළ විස්තරය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ, අධිකාරි පත්තුවේ, මීගහවත්ත පිහිටි කෝන්ගහවත්ත හෙවත් කොස්ගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. ජේ. ලියනගේ විසින් 2000.04.24 වන දින මැන සකස් කල අංක 8120 දරන පිඹුරේ ලොට් අංක සී 2 දරන කොටසට මායිම්, උතුරට : ලොට් සී 1 ද, නැගෙනහිරට : ලොට් ඩී ද, දකුණට : ලොට් සී 3, බස්නාහිරට : පාරද යන මායිම් තුළ පිහිටි පර්චස් දොලහ (අ. 0, රූ. 0, පර්. 12) ක විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි ගොඩනැගිලි ආදි සියළු දේත් වේ.

මෙම ඉඩම් ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී. 521/216 හි ලියා පදිංචි කර ඇත.

ඉහත ඉඩමේ පාරවල් සඳහා වෙන් කර ඇති කොටසේ මාර්ග අයිතිය ද සමහ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු.
ගම්පහ.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
ගම්පහ.

06-430

## මහජන බැංකුව - දෙල්ගොඩ ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.03.17 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

